**කාන්තාවන් විසින් ජනාධිපති අපේක්ෂකයින්ට සිදුකරන ඉල්ලීම**

**2024/2025 සඳහා කාන්තා ප්‍රතිපත්ති ප්‍රකාශනය**

**ප්‍රකාශනය**

මානව හිමිකම් රාජ්‍යය විසින් අගය කොට ආරක්ෂා කරන ලද සහ සියලු මිනිසුන්ට එක හා සමානව සලකන ආචාරධාර්මානුකූල දේශපාලන සංස්කෘතියක් සහ ප්‍රජාතන්ත්‍රවාදී සාධාරණ සමාජයක් පිළිබඳ ව කාන්තාවන් වශයෙන් අපි සඳහා බලාපොරොත්තු තබාගෙන සිටින්නෙමු. සෑම කෙනෙකුට ම හානියකින් තොරව, ගෞරවයෙන් ජීවත් විය හැකි, තමන්ගේ ම රැකියාවක් තෝරා ගත හැකි, රජය විසින් සපයනු ලබන ගුණාත්මක සෞඛ්‍ය සහ අධ්‍යාපනයට ප්‍රවේශ විය හැකි, පහසුකම් සහිත නිවාස ඇති සහ වගවීම ඇති සමාජයක් සහ රාජ්‍යයක් තුළ ජීවත් විය හැකි සමාජයක් නිමර්ාණය කරගැනීම සඳහා අපි උත්සාහ කරන්නෙමු.

සීමාකාරී ස්ත්‍රී පුරුෂ භාවීය භූමිකාවන් සහ හානිකර ඒකාකෘතින් තුළින් නිර්ණය වූ ‘ස්ත්‍රී පුරුෂ සමාජභාවය’ පිළිබඳ සමාජ ගතානුගතික අර්ථකථනයක් හරහා කාන්තා අයිතිවාසිකම් ඓතිහාසිකව සීමා කර ඇති බව අපි අවධාරණය කර සිටින්නෙමු.

යුක්තියට ප්‍රවේශවීමේ අයිතිය සහ යුක්තිය පසිඳලීමේ ක්‍රමය තුළ සාධාරණ සැලකිල්ලක් ලැබීම කාන්තාවන්ට සහ අනෙකුත් ඓතිහාසික වශයෙන් කොන් කරන ලද ප්‍රජාවන්ට තිබිය යුතු බව අපි තහවුරු කරමු. සියලු ම සේවා ස්ථාන ආරක්ෂිත සහ අන්තගර්තකරණය කරන ලද වටපිටාවන් විය යුතු ය. රාජ්‍යය විසින් මෙම මූලධමර්ය ආරක්ෂා කළ යුතු අතර, එය ආරක්ෂා කිරීමට පෞද්ගලික අංශයට බල කළ යුතු ය.

**අපේ ඉල්ලීම්:**

1. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර කැබිනට් මණ්ඩලය හරහා පාලර්මේන්තුවට හිතෛෂී විධායකයක් සහිත ව්‍යවස්ථාමය ව්‍යුහයක් හඳුන්වා දීම.
2. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම.
3. කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව 20 නොඉක්මවන බවත්, කැබිනට් මණ්ඩලයෙන් 50%ක් කාන්තාවන්ගෙන් සමන්විත බවත් සහතික කිරීම.
4. මනාප ඡන්ද ක්‍රමය අහෝසි කිරීම සහ සරල බහුතර නියෝජන ක්‍රමය සහ සමානුපාතික නියෝජන ක්‍රමයේ එකතුවක් මත පදනම් වූ නව මැතිවරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම.
5. පාලර්මේන්තු මන්ත්‍රීන් පක්ෂමාරු කිරීම වැළැක්වීමේ නව නීති හඳුන්වාදීම සහ මන්ත්‍රීවරුන් ඔවුන්ගේ ආසනවලින් ඉවත් කිරීමට පුරවැසියන්ට ඇති අයිතිය ලබා දීම.
6. පාලර්මේන්තුවේ, පළාත් සභා සහ ප්‍රාදේශිය සභා මට්ටමේ රජයේ ආයතනවල තීරණ ගැනීමේ මට්ටම ඇතුළුව අවම වශයෙන් 30% කාන්තා නියෝජනයක් සහතික කිරීම සඳහා තාවකාලික විශේෂ ක්‍රියාමාගර් සම්පාදනය කිරීම සහ වසර 10ක කාලයක් තුළ සමාන නියෝජනයක් සාක්ෂාත්කරගැනීම සඳහාවන ක්‍රමානුකූල වර්ධක පියවරයන් හඳුන්වාදීම.

7. සියලු ම ලියාපදිංචි දේශපාලන පක්ෂවල ප්‍රධාන තීරණ ගැනීමේ ව්‍යුහයන් තුළ අවම වශයෙන් 30% කාන්තාවන් සිටින බව සහතික කිරීම සඳහා අනිවාර්ය නීතිමය ප්‍රතිපාදන හඳුන්වා දීම.
8. සියලු ම ස්වාධීන කොමිෂන් සභා පත්කිරීම්වල දී ස්ත්‍රී පුරුෂ සමතුලිතතාවයක් සහතික කිරීම.
9. සියලු ම ජාතික විෂයමාලා තුළ සාමය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ අධ්‍යාපනය ඇතුළත් කිරීමෙන් අනාගත පරපුරේ ප්‍රගතිශීලී චින්තනය සහතික කිරීම.
10. සියලු ම ජාතික මට්ටමේ දත්ත එක් රැක් කිරීමේ දී ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය වෙන් කර ඇති බව සහතික කිරීම.
11. සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම පිළිබඳ ව්‍යවස්ථාපිත බැඳීම් ඉටු කිරීම සහ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළු සියලු ම පුද්ගලයින්ගේ සමාජ-ආර්ථික හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ක්‍රියාමාගර් හඳුන්වා දීම සහතික කිරීම.
12. ආගමික පූජකවරුන් ඇතුළු සියලු පුරවැසියන්ට නීතිය සමානව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
13. ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය කාන්තාවන්ගෙන් බහුතරයකින් සමන්විත වනු ඇති බව හඳුනාගෙන, නිවාස, සෞඛ්‍ය, ජීවනෝපාය සහ ප්‍රවාහනය ඇතුළු ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතා සහ ගැටලු විසඳීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ**

14. මහජන නියෝජිත කමිටුව සහ ව්‍යවස්ථාදායක සභාවේ අනු කමිටු විසින් සිදු කරන ලද නිදෙර්ශයන් සැලකිල්ලට ගනිමින් ව්‍යවස්ථාදායක සභාව හරහා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීම.
15. ජීවත්වීමේ අයිතිය සැමට ඇති මූලික මානව අයිතිවාසිකමක් ලෙස පිළිගැනීම.

**මෙම ක්‍රියාවලියේ දී පහත කරුණු සැලකිල්ලට ගන්න:**

16. කාන්තාවන් ඓතිහාසික වශයෙන් වෙනස් කොට සැලකීමට සහ කොන් වීමට ලක් වී ඇති බවට පිළිගැනීම හා කාන්තාවන්ට ස්වයං පාලනයක් ක්‍රියාත්මක කිරීමට සහ ශාරීරික අනෛන්‍යතාවය භුක්ති විඳීමට ඇති අයිතිය; ලිංගික අයිතිවාසිකම් සහ ප්‍රජනක සෞඛ්‍යය, ප්‍රචණ්ඩත්වයෙන් මිදී ගෞරවාන්විතව ජීවත් වීමට ඇති අයිතිය, එවැනි ප්‍රචණ්ඩත්වය සහ එහි ප්‍රතිවිපාක සඳහා ඵලදායී පිළියම් සහ පිළියම් සඳහා ඇති අයිතිය හඳුනාගැනීම.
17. නීති සම්මත කිරීමෙන් පසු ඒවායේ ව්‍යවස්ථාපිතභාවය තීරණය කිරීම සඳහා අධිකරණ ඉදිරියට යෑමේ හැකියාව තිබීම.
18. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි වගන්තිය ඉවත් කිරීම.
19. 12 වැනි වගන්තියෙන් ව්‍යංගයෙන් ඇතුළත් කර තිබුණ ද, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය පැහැදිලි කාණ්ඩ ලෙස හඳුන්වා දී, ඓතිහාසික ව සහ අඛණ්ඩ ව සිදුවන වෙනස්කම් කිරීම් හඳුනා ගනිමින් වෙනස්කොට නොසැලකීමේ වගන්තිය යටතේ ආරක්ෂාව සහතික කිරීම.
20. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් මූලික අයිතිවාසිකම් ලෙස සහතික කර ඇති අතර ඒවා අධිකරණයේ බලාත්මක කළ හැකිවීම.
21. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමානාත්මතා වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ වගවීම පිළිගැනීම.

**මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ**

22. මානව හිමිකම් සහ වෙනස් කොට නොසැලකීම් සියලු නීති සම්පාදනයේ දී සහ රාජ්‍ය ව්‍යුහයේ කේන්ද්‍රය බවට පත් කිරීමට කැපවීම.
23. CEDAW ඇතුළු සියලු ම අනුමත ජාත්‍යන්තර ප්‍රඥප්ති සහ නීති ක්‍රමානුකූලව දේශීය නීතියට ඇතුළත් කිරීම සහ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වීම සඳහා පවතින නීති සංශෝදනය කිරීම.
24. සංහිඳියා යාන්ත්‍රණය (2017) උදෙසා ප්‍රචාරණ කාර්ය සාධක බලකායේ නිදෙර්ශ ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම.
25. දේපල උරුමය, දේපළ අත්පත් කර ගැනීම, දේපල කළමනාකරණය, ඒවා පරිපාලනය සහ බැහැර කිරීම සඳහා සියලු ම කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු බවට සහතික වීම සහ එම අයිතිවාසිකම් වලක්වන සියලුම වෙනස් කොට සැලකීමේ නීති (විශේෂයෙන් තේසවලමෙයි නීතිය සහ ඉඩම් සංවධර්න ආඥාපනත ඇතුළුව) අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සහතික කිරීම.
26. ජනාධිපති ධූරය ලබා ගැනීමෙන් මාස හයක් ඇතුළත 1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සංශෝධනය කිරීම, මුස්ලිම් කාන්තාවන්ගේ ඉල්ලීම් සම්පූණර්යෙන් සාක්ෂාත් කර ගැනීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම්වලට පූණර් අනුකූල වීම සහතික කිරීම.
27. දේශපාලන ජීවිතය තුළ කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ ගැටලු පිළිබඳව නීති සම්පාදනය කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය සහ මැතිවරණ නීති සංශෝධනය කිරීම.
28. මෙහි සඳහන් කර ඇති සියලු ම ක්ෂේත්‍ර තුළ මානව හිමිකම් සහ වෙනස් කොට සැලකීම පිළිබඳ පොදු අධ්‍යාපනය ලබාදීම රාජ්‍යයේ ප්‍රධාන ප්‍රමුඛතාවයක් බව සහතික කිරීම.
29. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අවලංගු කිරීම සහ සාකච්ඡාවට ලක්ව ඇති ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත බලාත්මක නොකිරීමට කැපවීම; ඒ වෙනුවට සියලු පුරවැසියන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සාමාන්‍ය අපරාධ නීතියේ විධිවිධාන භාවිත කිරීම.
30. සංගමයේ සහ විසම්මුතියේ නිදහස ආරක්ෂා කිරීම සඳහා ස්වේච්ඡා සමාජ සේවා ආඥාපනත (VSSO) සංශෝධනය කර ඇති බව සහතික කිරීම සහ සියලු ම රාජ්‍ය නොවන ආයතන අනෙකුත් සියලුම නීතිමය ආයතනවලට සමාන නීතිමය සහ නියාමන ක්‍රියාමාගර්වලින් සැලකීම.
31. අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය සාධාරණ හා යුක්ති සහගත ලෙස ක්‍රියාත්මක වන බවටත් දේශපාලන හේතූන් මත අපයෝජනයට ලක් නොවන බවටත් එහි සීමාව තුළට එන සියලු දෙනාගේ අයිතිවාසිකම් කඩ නොවන බවටත් සහතික වීම.

**තොරතුරු සහ වෛරී ප්‍රකාශන**

32. බහු සංස්කෘතිකත්වය දිරිමත් කිරීම සහ ප්‍රමුඛත්වය ලබා දීම සහතික කිරීම, එමගින් ජාතික සහජීවනය ස්ථාපිත කිරීම හා මෙය සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් නීතිගත කිරීමට කැප වීම.
33. මාගර්ගත අපයෝජනයෙන් මිදුනු ශේෂිතයන් සහ වින්දිතයින් ආරක්ෂා කිරීමට සහ අපරාධකරුවන්ට එරෙහිව නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා යෝජිත මාගර්ගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත් කෙටුම්පත සංශෝධනය කිරීම.
34. ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීමේ සිද්ධීන් සම්බන්ධයෙන් සමාජ-දේශපාලන හා ආගමික තරාතිරම නොතකා සියලු අපරාධකරුවන්ගේ වගවීම තහවුරු කිරීම.
35. රාජ්‍ය අංශය ඇතුළු ව රාජ්‍ය අධ්‍යාපනය සහ ධාරිතා ගොඩනැගීම හරහා තොරතුරු දැනගැනීමේ අයිතියේ (RTI) ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණ ශක්තිමත් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට කැපවීම.

**භාෂාව සහ සංස්කෘතිය**

36. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය අංශයේ අනුකූලතාවය සහතික කිරීම.
37. සංස්කෘතිය පිළිබඳ නව ජාතික ප්‍රතිපත්තිය ඇතුළුව ප්‍රතිපත්ති, නීති සම්පාදනය, අධ්‍යාපනය සහ භාවිතයන් හරහා ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්කෘතික බහුවිධවාදය වඩාත් අගය කිරීම සහතික කිරීම.
38. ඉහත කරුණු ක්‍රියාත්මක කිරීමේ දී, සංස්කෘතිය සියලු පුරවැසියන්ගේ මානව හිමිකම් ඉක්මවා නොයන බවට වගබලා ගැනීම.

**සංවර්ධනය, සම්ප්‍රදායික ජීවනෝපාය සහ පාරිසරික යුක්තිය**

39. සමාජ-ආර්ථික තත්ත්වය, වාගරීකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආබාධිතභාවය, වයස සහ යනාදිය නොසලකා සියලු සංවර්ධන ප්‍රතිපත්ති අන්තගර්තකරණය කිරීම සහ සියලු ප්‍රජාවන්ට ඒවායින් ප්‍රතිලාභ සැලසෙන බවට සහතික වීම.
40. දරිද්‍රතාවය ස්ත්‍රීකරණය වීම හඳුනාගැනීමක් වශයෙන් දරිද්‍රතාවයේ සිටින කාන්තාවන්ගේ ගැටලු විසඳීම සඳහා විශේෂ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට කැපවීම.
41. තිරසර කෘෂිකාමරීක සහ පාරිසරික කළමනාකරණය සඳහා කාන්තාවන්ගේ දායකත්වය හඳුනාගෙන, කාන්තාවන් සඳහා ඉඩම් අයිතිය සහ අනෙකුත් ආර්ථික සම්පත් සහතික කිරීම ඇතුළුව, මෙම අංශයේ ඔවුන්ගේ කායර්භාරය ආරක්ෂා කිරීමට පියවර ගැනීම.
42. සංවර්ධන ව්‍යාපෘතිවල ආරම්භක සංකල්පීය අවධියේ දී පාරිසරික ඇගයීම් අනිවායර් කිරීම.
43. නියඟය, ලැව්ගිනි, ගංවතුර, නාය යෑම් සහ වෙරළ ඛාදනය වැනි දේශගුණික විපයර්ාස නිසා සිදුවන විවිධ ආපදා සහ අනතුරු අවම කිරීම සඳහා පාරිසරික අභියෝගවලට මුහුණ දීම සඳහා පුළුල් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.
44. දේශගුණික විපයර්ාසවල බලපෑම් වැළැක්වීම සහ අවම කිරීම සඳහා කැපවූ සම්පත් සමඟ ක්ෂණික හා ස්ථාවර පියවර ගැනීම.
45. විශ්‍රාම වැටුප් වැඩි කිරීම සහ ගොවීන්ගේ ණය කපා හැරීම මගින් කාන්තා සහ පිරිමි ගොවීන් යන දෙපාශර්වයට ම සහාය වීම.
46. වඩාත් අන්තගර්තකරණය කරන ලද ප්‍රතිපත්ති සහ සම්පත් හරහා කාන්තාවන්ගේ ඇතුළු සාම්ප්‍රදායික ජීවනෝපායන් සඳහා සහාය සැලසීම.
47. සාම්ප්‍රදායික බීජ භාවිතය ව්‍යාප්ත කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය වැඩි කිරීම සහ සංස්ථාවන් විසින් බීජවල ඒකාධිකාරයක් අත්පත් කර ගැනීම වැළැක්වීම.
48. වන වගාව විනාශ නොකිරීම සහතික කිරීම සහ සංවේදී පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීම.
49. උල්ලංඝණය කිරීම්වල දී දණ්ඩමුක්තියකින් තොර ව සියලු ම පාරිසරික නීති ක්‍රියාත්මක කරන බවට සහතික වීම.
50. ජෛව ස්කන්ධ බලය, සුළං බලය, සූයර් බලය සහ සාගර බලශක්තිය වැනි පුනජර්නනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීමෙන් බලශක්ති සුරක්ෂිතභාවය සහතික කිරීම සහ පොසිල ඉන්ධන මත යැපීම අඩු කිරීම.

**ශ්‍රමය සහ රැකියා**

51. ජාතික ශ්‍රම බලකා සමීක්ෂණයට සහ දළ දේශීය නිෂ්පාදිතය තක්සේරු කිරීමේ දී වැටුප් නොලබන සුරැකුම් සේවා ඇතුළත් කිරීම.
52. වැටුප් සහිත රැකියා සඳහා කාන්තාවන්ට ප්‍රවේශවීමේ සමානාත්මතාවය සහතික කිරීම

සඳහා වැටුප් නොලබන සුරකුම් වැඩ හඳුනා ගැනීම, අවම කිරීම සහ නැවත බෙදා හැරීම සඳහා සියලු සංවර්ධන මැදිහත්වීම් වලදී පියවරයන් හඳුන්වා දීම.

53. පීතෘ නිවාඩු සඳහා අවම වශයෙන් දින 100 ක් හඳුන්වා දෙන්න.
54. විධිමත් සහ අවිධිමත් අංශවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ වැටුප් පරතරයට තුඩු දෙන වෙනස් කොට සැලකීමේ භාවිතයන් ආමන්ත්‍රණය කිරීම.
55. ක්ෂුද්‍ර මූල්‍ය සහ ක්ෂුද්‍ර ණය ආයතන ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා දැඩි නීති සහ රෙගුලාසි හඳුන්වාදීම සහ බලාත්මක කිරීම.
56. රැකියා ලෝකයේ ලිංගික හිරිහැර වැළැක්වීම පිළිබඳ ILO 190 සම්මුතිය අපරානුමත කිරීම.
57. ගෘහ සේවිකාවන් සඳහා විනීත වැඩ පිළිබඳ ILO 189 සම්මුතිය අපරානුමත කිරීම.
58. විදේශ රැකියා සඳහා කාන්තාවන්ට සංක්‍රමණය වීමට ඇති අයිතිය සීමා කරන සියලු ම වෙනස් කොට සැලකීමේ රෙගුලාසි ඉවත් කර ගැනීම.
59. සියලු ම කාන්තාවන්ට ඔවුන් තෝරාගත් රැකියාව නොසලකා නීතියේ ආරක්ෂාව සහතික කිරීම, එමගින් කාන්තාවන්ට තමන් කැමති රැකියාවක් කිරීමට නිදහස ලබා දීම.
60. කාන්තා සහ පිරිමි සංක්‍රමණික සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම.
61. සියලු ම පුරවැසියන් සඳහා තමන් දායක වන විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දී එය ජීවන වියදම් දර්ශකයට සම්බන්ධ කර ඇති බව සහතික කිරීම.

**කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතිවාසිකම්**

62. ස්ත්‍රී දූෂණය (වෛවාහක ස්ත්‍රී දූෂණය ඇතුළත් කිරීම), වධහිංසා පැමිණවීම (ලිංගික ප්‍රචණ්ඩත්වය ඇතුළත් කිරීම) සහ ලිංගික හිරිහැර පිළිබඳ නීතිමය අර්ථ දැක්වීම් පුළුල් කිරීම. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ආකාර නිර්වචනයට අන්තර්ජාල තාක්ෂණය ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය ඇතුළත් කිරීම.
63. දඬුවම් නියම කිරීමේ දී ඉහත පුළුල් නිර්වචන පිළිබිඹු විය යුතුවීම, ස්ත්‍රී දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් අත්හිටවූ දඬුවම් තහනම් කිරීම.
64. ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ නීතිය මගින් සියලු ම ප්‍රජාවන්ට අයත් සියලු ම ගැහැනු ළමයින් එක හා සමානව ආරක්ෂා කර ඇති බවට සහතික වීම.
65. අවශ්‍ය වූ විට නීති සම්පාදනය කිරීම සහ දිවි ගලවා ගත් අයගේ/වින්දිතයාගේ සාක්ෂිය කේන්ද්‍රගත වන සාක්ෂි රැස් කිරීමේ ප්‍රමිතිගත භාවිතයන් බලාත්මක කිරීම සහ ස්ත්‍රී දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ස්වාධීනව තහවුරු කිරීමේ ක්‍රියාවලිය අහෝසි කිරීම.
66. ජනාධිපති ධූරය ලබා ගැනීමෙන් මාස හයක් ඇතුළත 2005 ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනතට සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක දෙපාතර්මේන්තුවට ඉදිරිපත් කිරීම.
67. දණ්ඩ නීති සංග්‍රහයේ 303 වගන්තිය අවලංගු කර සියලු ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය සේවා තේරීම් සඳහා ශක්තිමත් ප්‍රවේශය සහතික කිරීම.
68. දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ 2023 විශේෂ තීරණයට අනුකූලව වැඩිහිටියන් අතර කැමැත්තෙන් සිදුවන සමලිංගික සබඳතා අපරාධයක් බවට පත් කරන දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති අවලංගු කිරීම.
69. සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන්ට වෙනස් කොට සැලකීම නීත්‍යානුකූල කිරීම සඳහා භාවිත කෙරෙන 'අනෙකෙකු ලෙස පෙනීසිටීම' අපරාධයක් බවට පත් කරන දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය සංශෝධනය කිරීම; පොලිස්පතිවරයා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකයේ වලංගුභාවය අනුමත කිරීම සහ එම ලේඛනය වලංගු එකක් සේ සලකන ලෙස සියලු ම පොලිස් ස්ථානවලට නියෝග නිකුත් කිරීම.
70. අල්ලස් පනත සංශෝධනය කර ලිංගික අල්ලස් ලබා දීමේ ක්‍රියාව පැහැදිලිව ඇතුළත් කිරීම.
71. අයාලේ යෑමේ අඥා පනත අවලංගු කිරීම.

72. දෙමාපියන්ගේ විවාහක තත්ත්වය සම්බන්ධයෙන් උප්පැන්න සහතිකයේ ඇති ප්‍රශ්නය ඉවත් කිරීම.
73. කාන්තාවන්ට බලපාන සියලු ම ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාදායක මැදිහත්වීම් කාන්තාවන්ගේ ජීවත්වන යථාථර්යන් පිළිබිඹු කරන සාක්ෂි මත පදනම් වූ බවට සහතික වීම.
74. ගුරු පුහුණුව ඇතුළු සියලු අධ්‍යාපන විෂයමාලාවල අනිවාර්ය අංගයක් ලෙස වයස් කාණ්ඩයට ගැළපෙන පුළුල් ලිංගික සහ ප්‍රජනක අධ්‍යාපනය ඇතුළත් කිරීම.

**ආයතන සහ ප්‍රතිපත්ති**

75. ආණ්ඩුවේ වෙනස්කම් නොතකා අධිකරණයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා නීති සම්පාදනය කිරීම.
76. නීතිපති කාර්යාලය දෙකොටසකට බෙදමින් රජයට එරෙහිව ඇතුළු සියලු ම නඩු පැවරීමේ කාර්ය භාර ගනිමින් මහජන නඩු පැවරීමේ අධ්‍යක්ෂක මණ්ඩලයක් හඳුන්වා දීම.
77. සෑම පුද්ගලයෙකුට ම යුක්තියට ප්‍රවේශ වීමට ඇති අයිතිය ක්‍රියාත්මක කළ හැකි බවත් මෙම අයිතිය යුක්ති සහගත බවත් සහතික කර ගැනීම. මෙම අයිතිය උල්ලංඝණය වන අවස්ථාවන්හි දී, වින්දිතයාට කාලෝචිත ප්‍රතිකර්ම සඳහා ප්‍රවේශය සහ අවශ්‍ය ඕනෑ ම ක්‍රියාවකට සහාය වීමට ඉක්මන් සහන ලබාගත හැකි වීම.
78. කාන්තා හිංසන සිද්ධීන් පිළිබඳ නඩු වසරක කාලසීමාවක් තුළ උපරිම වශයෙන් අවසන් කර ඉක්මන් විමශර්න කටයුතු සහ නඩු පැවරීම සඳහා අවශ්‍ය මානව හා ද්‍රව්‍යමය සම්පත් සැපයීම.
79. කාන්තා ප්‍රචණ්ඩත්වයට අදාළ ව දැනට පවතින සියලු ම ජාතික ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනයක් පවත්වා එක මෙවලමක් බවට ඒකාබද්ධ කිරීම.
80. සෑම පොලිස් ස්ථානයක ම ප්‍රාදේශීය භාෂාවන් පිළිබඳ ප්‍රවීණතා ඇති ප්‍රමාණවත් පුහුණුව ලත් නිලධාරීන්ගෙන් සමන්විත මනා සම්පත් සහිත කාන්තා හා ළමා අංශයක් තිබිය යුතු බවත්, මෙම සේවාව දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක විය යුතු බවත් නියෝග කිරීම.
81. කාන්තා ගෘහ මූලිකයන් සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම, ඔවුන්ට හානිවලින් හා පීඩාවලින් තොරව, අභිමානයෙන් යුතුව, ඔවුන්ගේ සමාජ-ආථර්ික අයිතීන් සුරැකෙන, සහ සමාජ සුබසාධන ප්‍රතිලාභ සඳහා ප්‍රවේශය ශක්තිමත් කිරීමට හැකි පරිසරයක් සලසා දීම.
82. මාතෘ හා ළමා සෞඛ්‍ය සඳහා අයවැයේ මූල්‍ය ප්‍රතිපාදන 3% දක්වා වැඩි කිරීමට කැපවීම.

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
56/1, සරසවි පටුමග,
කාසල් වීදිය,
කොළඹ 08
0112 690 192